මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :LAE/2025/67** **2025.04.23**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06
### ඔබේ අපේක්ෂකයා දැන ගන්න

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 සඳහා දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇති බැවින් ඡන්ද දායකයාට නියමිත පළාත් පාලන ආයතනයේ අපේක්ෂක ලැයිස්තුව පහසුවෙන් ලබා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේ.

https://eservices.elections.gov.lk යොමුව හරහා මැතිවරණ ඉ සේවා වෙත පිවිස එහි **"පුරවැසියන් සඳහා"** වන යොමුවෙන් **"මැතිවරණය සඳහා ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු"** ඉ සේවාව වෙත පිවිස තම හැඳුනුම්පත් අංකය ඇතුළත් කළ පසු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025 ට අදාළ ඡන්ද හිමි ලියාපදිංචි තොරතුරු දැක්වෙන අතර එහි පහළ ඇති "**KYC**" යොමුව මගින් ඡන්ද හිමියාට අදාළ පළාත් පාලන ආයතනය වෙනුවෙන් තරග වදින අපේක්ෂකයන්ගේ තොරතුරු ඉතා පහසුවෙන් දැනගත හැකි ය.

**ec.lk/vre** යොමුව මඟින් හෝ පහත QR කේතය පරිලෝකනය මගින් මෙම ඉ සේවා ව වෙත පහසුවෙන් පිවිසිය හැකි ය.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්